**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය - 2018**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික වියයුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 31 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

---------------------

**2.1 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| **(i) මුදල් රෙගුලාසි 261 (1) හා 261 (2)** | 2018 දෙසැම්බර් වවුචර් ගොනුවේ (පිටු අංක 1 සිට 208 දක්වා) හා නොවැම්බර් වවුචර් ගොනුවේ (පිටු අංක 1 සිට 150 දක්වා ) සියලුම වවුචර් වල අදාල ස්ථානයන් හි වවුචර් අංක හා චෙක්පත් අංක යොදා නොතිබුණි. | ආයතනයේ එවකට ස්ථිර ගණකාධිකාරිවරයෙකු නොමැති වීම මත අදාල වවුචර් පත්‍ර නිසි ලෙස සකසා නොතිබූ අතර ඉදිරියේ දී නිසිලෙස සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සියළුම ගෙවීම් වවුචර් වල අදාල ස්ථානයෙහි වවුචර් අංකය, චෙක්පත් අංකය යෙදිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** මුදල් රෙගුලාසි 396 (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට ආයතනය ඉදිරිපත් කර ඇති බැංකු සැසඳුම් විස්තරය අනුව රු.16,924 ක් වටිනාකම වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ආයතනයේ එවකට ස්ථිර ගණකාධිකාරිවරයෙකු නොමැති වීම නිසා එකී ගැටලු සහගත තත්ත්වයන් උද්ගත වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| **(i)** 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛය | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2018 ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොමැති අතර ඉදිරියේ දී එකී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(ii)** 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය | තත්කාර්යය අත්තිකාරම් කටයුතු ආයතනය තුල සිදු වූයේ ද යන්න පවත්නා අත්තිකාරම් ලේඛනය තුලින් ප්‍රමාණවත් පරිදි නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ස්ථිර ගණකාධිකාරිවරයෙකු නොමැති වීම නිසා එකී ගැටලු සහගත තත්ත්වයන් උද්ගත වී ඇති බව පිලිගනිමි. ඉදිරියේදී එවැනි ගැටළු මග හැරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් විනිසුරුවරුන්, මහාධිකරණ විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චය සභා සභාපති, ක්වාසි විනිසුරුවරුන්, අධිකරණ නිලධාරීන් වෙනුවෙන් පුහුණු සැසි 25 ක් හා පුහුණු වැඩසටහන් 49 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට පැවැත්වීමට සැලසුම් කර තිබුණද පුහුණු සැසි 20 ක් හා පුහුණු වැඩසටහන් 13 ක් පමණක් පවත්වා තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මේ 4 ඡේදයේ අරමුණු 06 හා 07 වශයෙන් දක්වා තිබූ | 2018 වර්ෂය වනවිට විනිශ්චයකාරවරයන්ගේ ශ්‍රවණාගාරයේ වහලයේ පරවියන් ගහනය නිසා අධික දුර්ගන්ධය හේතු වෙන් වැඩමුලු පැවැත්වීමට නොහැකි විය. මේ හේතුව නිසා වර්ෂයට අදාලව තිබූ නියමිත පුහුණු සැසි ප්‍රමාණය පැවැත්වීමට නොහැකි වූ බව දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනිමට කටයුතු කළ යුතු වේ. |

උසාවි කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් 16 පවත්වා නොතිබුණි.

**2.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ලෙජරය හා ජ'නල් සටහන් පවත්වාගෙන ගොස් නොමැති බැවින් ආයතනයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳව සෑහීමකට පත්වීමට නොහැකි විය. | 2018 වර්ෂය වන විට ආයතනයේ ස්ථිර ගණකාධිකාරීවරයෙකු නොසිටී බැවින් එම ගැටලු සහගත තත්ත්වයන් උද්ගත වී ඇති අතර ඉදිරියේ දී එවැනි ගැටළු ඇති නොවීමට කටයුතු කරමින් සිටී. | ගිණුම් ලේඛණ සහ පොත්පත් පවත්වා අදාල ගණුදෙනු නිවැරදිව සටහන් කර ගිණුම් යාවත්කාලීන කළ යුතු වේ. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු. මිලියන 6 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට වියදම රු. මිලියන 0.22 ක් විය. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය සියයට 3.65 ක් වූ බැවින් ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය ඉතා පහත් මට්ටමක පැවතුනි. | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.මිලියන 06 ක් වූ අතර එයින් 2018.12.31 දින වන විට වියදම රු.මිලියන 0.22 කි. පහත හේතූන් මත මිලදී ගැනීම් සිදු නොවූ බව දන්වා සිටිමි.<br>**පුස්තකාලයට පොත්මිල දී ගැනීමට**<br>අපේක්ෂා කල නමුත් 2018 වර්ෂය වන විට ඉහල මහලයේ නවීකරණ කටයුතු කිරිම සඳහා පුස්තකාලය එම ස්ථානයෙන් ඉවත් කිරීමට අපේක්ෂාවෙන් සිටීම හේතුවෙන් පොත් මිල දී ගැනීමක් සිදු නොවුනි.<br>**ඡායා පිටපත් යන්ත්‍ර මිල දී ගැනීමට**<br>අපේක්ෂා කල නමුත් අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ | ඇස්තමේන්තු සැකසීමේ දී ඒවා ඉටු කර ගැනිමට ඇති හැකියාව ද සැලකිල්ලට ගත යුතු අතර ප්‍රතිපාදනයන් මුදලට අගයක් ඇතිවන ආකාරයට උපයෝජනය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | ශ්‍රවනාගාරයේ ඒ වන විට වහලයේ පරවියන්ගේ ගහනය හේතුවෙන් සති අන්ත වැඩමුලු පැවැත්වීමේ හැකියාවක් නොතිබුණි. මේ හේතුව මත නව ඡායා පිටපත්යන්ත්‍ර මිල දී ගැනීමක් සිදු නොවුණි.<br><br>**ලී බඩු සහ පුටු මිල දී ගැනිම** සිදු නොවුයේ ඉහල මහලයේ වහලය නවීකරණය කිරීමට නියමිතව තිබීම හේතුවෙන් වැඩමුලු නොපැවැත්වීම. 2018 වර්ෂය වන විට ඉහල මහලයේ ශ්‍රවනාගාරයේ සහ පුස්තකාලයේ නවීකරණ කටයුතු සඳහා යුධ හමුදාව, නාවික හමුදාව මගින් සිදු කිරීමට සැලැසුම් කර තිබුණ ද එසේ සිදු නොවුණි. පසුව අධිකරණ අමාත්‍යාංශය මඟින් අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන ලදී. **වර්තමාන තත්ත්වය: දැනට වැඩ කටයුතු අවසන් වෙමින් පවතියි.** | |

**2.4** **කාර්ය මණ්ඩල කළමනාකරණය**

---------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 24 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 13 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් විය. පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 46 ක් විය. පුරප්පාඩුව පැවති තනතුරු අතර ආයතනයේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඍජු දායකත්වයක් ලබා දෙන පර්යේෂණ නිලධාරි, සහකාර ගණකාධිකාරි හා කළමනාකරණ සහකාර යන තනතුරු විය. | 2018 වර්ෂය වන විට මේ සම්බන්ධයෙන් පියවරක් ගෙන නොතිබූ අතර වර්තමාන තත්ත්වයට අනුව සියළුම පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා ඇති බව සඳහන් කරමි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |